

# සෞඛ්‍ය රක්ෂණාවරණ ගැන ඔබ දැනගත යුතු දේ

## 1. සෞඛ්‍ය රක්ෂණය යනු කුමක්ද?

සෞඛ්‍ය රක්ෂණයක දී සිදුවන්නේ ඔබගේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා වැයවන වියදම් ඔබ විසින් ලබාගෙන ඇති සෞඛ්‍ය රක්ෂණාවරණය යටතේ ප්‍රතිපූරණය කිරීමයි. අනෙකුත් රක්ෂණාවරණයන් මෙන්ම, සෞඛ්‍ය රක්ෂණයක් යනු රක්ෂණ සමාගමක් හා තනි පුද්ගලයකු හෝ පිරිසක් අතර ඇතිවන ගිවිසුමකි. යම් නිශ්චිත වාරිකයකට සහ ඔප්පුවේ සඳහන් කොන්දේසිවලට යටත්ව වෛද්‍ය ප්‍රතිකාර සඳහා දැරීමට සිදුවන වියදම් මෙහිදී ප්‍රතිපූරණය කෙරේ. සාමාන්‍යයෙන් සෞඛ්‍ය රක්ෂණාවරණයක කාලසීමාව එක් වසරකි.

## 2. සෞඛ්‍ය රක්ෂණයක් වැදගත් වන්නේ ඇයි?

රෝහල්ගතවීමක දී හෝ අසාධ්‍ය රෝග හා හදිසි අනතුරකදී මුහුණපෑමට සිදුවන හදිසි සහ බලාපොරොත්තු නොවූ වියදම්, සෞඛ්‍ය රක්ෂණාවරණයක් මගින් ඔබට අවම කර ගැනීමේ හැකියාව ඇත. සෞඛ්‍ය රක්ෂණයක් නොතිබුණ හොත් මෙවැනි වියදම් පියවීමට සිදුවන්නේ ඔබගේ ඉතිරිකිරීම්වලින් හෝ ණයක් ලබාගැනීමෙනි. මීට අමතරව, ලබාගන්නා ඔප්පුවේ ස්වභාවය අනුව, රෝග නිවාරණ ප්‍රතිකාර මෙන්ම නිතිපතා කෙරෙන වෛද්‍ය පරීක්ෂණ වියදම් ද ආවරණය කරගැනීමේ හැකියාව ඔබට ඇත.

## 3. වෙළඳපොළේ ඇති සෞඛ්‍ය රක්ෂණ ඔප්පු වර්ග මොනවාද?

ශ්‍රී ලංකාවේ ඇති බොහෝ සෞඛ්‍ය රක්ෂණාවරණ මගින් රෝහල්ගතවීමක දී දැරීමට සිදුවන වියදම් ප්‍රතිපූරණය කරනු ලබයි. රක්ෂිතයාගේ අවශ්‍යතා සහ තේරීම මත විවිධ ආවරණයන් සලසන නවත් රක්ෂණාවරණ රැසක් ද වෙළඳපොළේ තිබේ. සාමාන්‍යයෙන් රක්ෂණ සමාගම විසින් සෘජුවම රෝහල වෙත ගෙවීම් කරනු ලබන අතර එසේ නොවන අවස්ථාවලදී ප්‍රතිකාර ගැනීමට වැයවූ වියදම් ප්‍රතිපූරණය කරනු ලබයි. සෞඛ්‍ය රක්ෂණයන් තනි රක්ෂණාවරණ ලෙස හෝ ජීවිත රක්ෂණාවරණයක අතිරේක ආවරණයක් ලෙසද ලබා ගත හැක.

## 4. ඔබගේ අවශ්‍යතාවයන්ට හොඳින්ම ගැලපෙන සෞඛ්‍ය රක්ෂණාවරණය තෝරා ගන්නේ කෙසේද?

ඔබගේ අවශ්‍යතාවයන්ට හොඳින්ම ගැලපෙන ආවරණය තෝරාගැනීමට සහ ඔබට අවශ්‍ය නොවන ආවරණ සඳහා මුදල් ගෙවීමෙන් වැළකීමට නම්, වෙළඳපොළේ තිබෙන විවිධ රක්ෂණාවරණයන් පිළිබඳව නිසි අධ්‍යයනයක් සිදු කිරීම වැදගත් වේ.

## 5. "පෙර සිට පැවත එන රෝග තත්වයන්" ඇත්නම් සිදුවන්නේ කුමක්ද?

යමෙකු සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා ගැනීමට පෙර සිටම පවතින රෝගී තත්වයන් (දියවැඩියාව, හදවත් රෝග හෝ පිළිකා ආදී) "පෙර සිට පැවත එන රෝග තත්වයන්" (pre-existing conditions) ලෙස හැඳින්වේ. එසේ පවතින රෝගී තත්වයන් රක්ෂණ සමාගම් විසින් සාමාන්‍යයෙන් ආවරණය කරන්නේ නැත. එසේ වුවද, ලබාගන්නා ඔප්පුවේ ස්වභාවය හා අදාල කොන්දේසිවලට අනුව, යම් පොරොත්තු කාලසීමාවකට (waiting period) පසුව පෙර සිට පවතින රෝග සඳහා ආවරණයක් ලබාදීම රක්ෂණ සමාගම් විසින් සලකා බලනු ඇත.

## 6. සෞඛ්‍ය රක්ෂණාවරණයක වාරිකය තීරණය කිරීමේ දී සැලකිල්ලට ගැනෙන කරුණු මොනවාද?

වයසින් අඩු පුද්ගලයකුට සාපේක්ෂව වයස්ගත පුද්ගලයකු රෝගාබාධයන්ට ගොදුරු වීමේ වැඩි ඉඩකඩක් ඇති හෙයින්, වයස වැඩිවන විට සාමාන්‍යයෙන් සෞඛ්‍ය රක්ෂණ වාරිකය ද වැඩි වේ. එබැවින්, රක්ෂිතයාගේ වයස වාරිකය තීරණය කෙරෙන ප්‍රධාන සාධකයක් වේ. එමෙන්ම රක්ෂිතයාගේ සහ පවුලේ සාමාජිකයන්ගේ රෝග ඉතිහාසය ද වාරිකයේ අගය තීරණය කිරීමේ දී සලකා බැලෙන ප්‍රධාන කරුණු අතර වේ. රෝගාබාධ සම්බන්ධයෙන් පෙර ඉතිහාසයක් නැත්නම් වාරිකය සාපේක්ෂ වශයෙන් අඩු වනු ඇත. ඒ ඒ රක්ෂණ සමාගමෙහි ප්‍රතිපත්ති සහ ඔබ ලබාගන්නා රක්ෂණාවරණයෙහි ස්වභාවය අනුව, එම රක්ෂණය අළුත් කිරීමේදී ගෙවිය යුතු වාරිකය තීරණය කිරීමේදී "වන්දි ඉල්ලුම් නොකළ වර්ෂයන්" (claim free years) ගණන, වැදගත් සාධකයක් ලෙස සැලකීමට ඉඩ ඇති අතර කිසියම් ප්‍රතිශතයකින් වාරිකය අඩු කිරීමටද රක්ෂණ සමාගම එකඟ විය හැක.

## 7. ඔබට ඔබේ සෞඛ්‍ය රක්ෂණ ඔප්පුව හොඳින් අවබෝධ කරගත හැකිද?

ඔබ සෞඛ්‍ය රක්ෂණ ආවරණයක් මිල දී ගැනීමට පෙර, ඔප්පුව හොඳින් කියවා තේරුම්ගැනීමට වග බලාගන්න. මේ සඳහා රක්ෂණ සමාගමෙන් ආදර්ශ රක්ෂණ ඔප්පුවක් ඔබට ඉල්ලාගත හැක. ඔප්පුව මගින් ලබාදෙන සියළු ප්‍රතිලාභ, ආවරණය කෙරෙන රෝගාබාධයන්, ප්‍රතිලාභ ගෙවීමේ දී අදාල වන යම් සීමාවන් (ඇත්නම්), කිසිසේත් ආවරණය නොවන රෝගාබාධයන් හා සේවාවන් මෙන්ම රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා සැපිරිය යුතු අවශ්‍යතා ආදිය රක්ෂණ ඔප්පුවේ සඳහන්ව ඇත. මේ සම්බන්ධයෙන් ඔබ සෑහීමට පත්වන්නේ නම් පමණක් එකී ඔප්පුව ලබා ගැනීම වැදගත් වේ.

---

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යනු, රක්ෂණ ඔප්පුහිමියන්ගේ හා අනාගත රක්ෂණ ඔප්පුහිමියන්ගේ යහපත ආරක්ෂා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම හා නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

වැඩි විස්තර සඳහා අමතන්න -

වෙළඳපල සංවර්ධන හා බාහිර සබඳතා ඒකකය
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01.
දුරකථන අංක : 011 2396184-9
ෆැක්ස් : 011 2396190
ඊමේල් : info@ibsl.gov.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk